# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

## ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශය

## මාර්ග සංවර්ධන අධිකාරිය

# ලංසු කැඳවීම

01. මාර්ග සංවර්ධන අධිකාරියේ පළාත්භාර අධ්‍යක්ෂ (ද.ප) කාර්යාලයීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන් පහත දැක්වෙන ව්‍යාපෘති සඳහා ඇස්පෝල්ට් (Asphalt) ලබා ගැනීම හා ඇස්පෝල්ට් සපයා යන්ත්‍රානුසාරයෙන් මාර්ග වල ඇස්පෝල්ට් අතුරා සැකසීම සඳහා මුද්‍රා තබන ලද මිළ ගණන් කැඳවනු ලැබේ.

| අනු අංකය | විස්තරය | දිස්ත්‍රික්කය | ලංසු ඇපකරය |
|---|---|---|---|
| 01 | කඹුරුපිටිය නගරයේ මාර්ග නඩත්තු කිරීම සඳහා අවශ්‍ය කරන ඇස්පෝල්ට් (Asphalt) සපයා යන්ත්‍රානුසාරයෙන් මාර්ග වල ඇස්පෝල්ට් අතුරා සැකසීම.<br>RDA/SP/M/RMTF/ 2024/01 | මාතර | 250,000.00 |
| 02 | හක්මණ නගරයේ මාර්ග නඩත්තු කිරීම සඳහා අවශ්‍ය කරන ඇස්පෝල්ට් (Asphalt) සපයා යන්ත්‍රානුසාරයෙන් මාර්ග වල ඇස්පෝල්ට් අතුරා සැකසීම.<br>RDA/SP/M/RMTF/ 2024/02 | මාතර | 250,000.00 |
| 03 | දික්වැල්ල බෙලිඅත්ත මාර්ගයේ කි.මී. 2+500 සිට කි.මී.4+000 දක්වා කොටස නඩත්තු කිරීම සඳහා අවශ්‍ය කරන ඇස්පෝල්ට් (Asphalt) සපයා යන්ත්‍රානුසාරයෙන් මාර්ගයේ ඇස්පෝල්ට් අතුරා සැකසීම.<br>RDA/SP/M/RMTF/ 2024/03 | මාතර | 250,000.00 |
| 04 | දෙනියාය විධායක ඉංජිනේරු කොට්ඨාශයට අයත් මාර්ග වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය ඇස්පෝල්ට් (Asphalt) සැපයීම.<br>RDA/SP/DC/EED/W&I/ASP/2024/01 | මාතර | 250,000.00 |
| 05 | බෙංගමුව මොලොග්ගමුව ගල්දොළ මාර්ගය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය ඇස්පෝල්ට් (Asphalt) සැපයීම.<br>RDA/SP/DC/EED/W&I/ASP/2024/02 | මාතර | 250,000.00 |

02. මිළ ගණන් කැඳවීම ජාතික තරගකාරී ලංසුකරන පටිපාටියට අනුව සිදුකරනු ලැබේ.

03. මිළ ගණන් පත් ගෙවීමකින්තොරව "පළාත්භාර අධ්‍යක්ෂ (දකුණු පළාත), මාර්ග සංවර්ධන අධිකාරිය, මැද්දවත්ත, මාතර" වෙතින් පරීක්ෂා කර බැලිය හැකිය.

04. මේ සඳහා උනන්දුවක් දක්වන සැපයුම්කරුවන් 2024.06.19 දින සිට 2024.07.03 දින දක්වා පෙ.ව.09.00 සිට ප.ව 03.00 දක්වා කාලය තුළ එක් මිළ ගණන් පතක් සඳහා ආපසු ගෙවනු නොලබන රුපියල් 1,500.00 (සියලු බදු රහිත) ගාස්තුවක් බැගින් සහ ලිඛිත අයදුම්පතක් "පළාත්භාර අධ්‍යක්ෂ (දකුණු පළාත) මාර්ග සංවර්ධන අධිකාරිය, මැද්දවත්ත, මාතර" වෙත ඉදිරිපත් කිරීමෙන් මිළ ගණන් ඉදිරිපත් කිරීමට අදාල අයදුම්පත් ලබාගත හැකිය.

05. සම්පූර්ණ කළ මිළගණන් පත් 2024.07.04 දින ප.ව. 02.00 ට පෙර "පළාත්භාර අධ්‍යක්ෂ (දකුණු පළාත)" මාර්ග සංවර්ධන අධිකාරිය, මැද්දවත්ත, මාතර යන ලිපිනයට එවීම හෝ කාර්යාලයෙහි ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ සිදුකළ යුතුය. ප්‍රමාදවී ලැබෙන මිළ ගණන් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මිළ ගණන් භාර ගැනීම අවසන් වූ වහාම ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරියේ එකී මිළ ගණන් විවෘත කරනු ලැබේ.

06. ඔබගේ මිළ ගණන් පත් බහා එවන කවරයේ වම්පස ඉහල කෙළවරෙහි **කොන්ත්‍රාත් අංකය** නිසි පරිදි සඳහන් කළ යුතුය.

07. ලංසු අවසන් කරන දින සිට කැලැන්ඩර් දින 91 ක් දක්වා ලංසුව වලංගු විය යුතුය. ලංසුව ලංසු ලේඛනයේ සඳහන් කොට ඇති ප්‍රමාණයේ ලංසු ආරක්ෂණයකින් (ලංසු වලංගු කාලයේ සිට තවත් දින 28 ක් දක්වා වලංගු) සමන්විත විය යුතුය.වලංගු ලංසු ආරක්ෂණයකින් සමන්විත නොවන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු පළාත්භාර අධ්‍යක්ෂ (ද.ප), පළාත්භාර අධ්‍යක්ෂ කාර්යාලය, මාර්ග සංවර්ධන අධිකාරිය, මැද්දවත්ත, මාතර වෙතින් ලබා ගත හැක. දු.ක. 041-2222150/041-2226109

**සභාපති**
**ප්‍රසම්පාදන කමිටුව**
**පළාත්භාර අධ්‍යක්ෂ කාර්යාලය (දකුණු පළාත)**
**මාර්ග සංවර්ධන අධිකාරිය, මැද්දවත්ත, මාතර**